# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2013

**සිංහල** | **4 වසර** | **කාලය පැය 3 යි**

* Iකොටසේ ප්‍රශ්න දෙකටද II කොටසින් එක් ප්‍රශ්නයක්ද III කොටසින් ප්‍රශ්න දෙකක් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

I කොටස.

01. (අ) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 250කට නොඅඩු වාක්‍ය රචනයක් ලියන්න.

i. සාරධර්ම සුරකින සමාජයක් ගොඩනගමු.
ii. ජලය රැකගතයුතු වටිනා සම්පතකි.
iii. ළමා පරපුර රැකගනිමු.
iv. ගසක් වවා රටක් රකිමු.
v. පිරිවෙන් අධ්‍යාපනය. (ලකුණු 25යි)

(ආ) පහත සඳහන් ඡේදය 1/3ක් වන සේ සාරාංශ කරන්න.

ශිෂ්ටාචාරයන්ගේ මුල් බිමක් ලෙස සැළකිය හැකි දකුණු ආසියා කලාපයට වසර දහස් ගණනක ඉතිහාසයක් ඇත. දකුණු ආසියාව පිළිබඳ කථා කිරීමේ දී ඉන්දු නිම්න ශිෂ්ටාචාරය හෙවත් මොහෙන්ජොදාරෝ හරප්පා ශිෂ්ටාචාරය අමතක කළ නොහැක. ඒ අනුව මානව පරිනාමයේ සහ සමාජ සංස්කෘතික පරිනාමය තුළ දකුණු ආසියාව ඉතා වැදගත් ඓතිහාසික වැදගත්කමක් සනිටුහන් කර තිබේ. ලෝකයේ ඉපැරණිම ආගම ලෙස සැළකෙන ලෝකයේ කෝටි සංඛ්‍යාත ජනතාවක් අදටත් වන්දනාමාන කරණු ලබන හින්දු ආගම ද වසර දෙදහස් පන්සියයකට වඩා ඉපැරණි බෞද්ධාගමේ ද නිජභූමිය වන්නේ ඉන්දියාවයි. (ලකුණු 10 යි)

02. පහත සඳහන් ගද්‍ය පද්‍ය කොටස් කියවා එහි අදහස ලිහිල් බසින් ලියන්න.

(අ) තවද කිර්ති ශ්‍රී රාජසිංහ නරේන්ද්‍රෝත්තම ප්‍රතිෂ්ඨාධාර බල මූලික සත්කෝරළේ බද මැද්දේපොල වේරමුණේ කන්ද කියන ස්ථානයෙහි වූ ගල්ලෙණෙහි දහසක් රියන් දිගින් බඳවන ලද සයන බුධරූපාදී වූ තුන්බෝ පිහිටුවීමෙන් කරන ලද ඒ ස්ථානයෙහි පූජා පවත්වන පිණිස සන්නස් සහිත ව ලැබුණු ගම් කුඹුරු ආදී ලාභයෙන් ඒ ස්ථානයෙහි පූජා සත්කාරත් හොඳින් පවත්වමින් බොහෝ ශිෂ්‍ය ගණයාටත් ලීම් කීම් බණදහම් පිහිටුවීමෙන් කල්යවා සිට (ලකුණු 10යි)

(ආ)
සතොස් කරන වීණා නද ඇසුමට
නොගොස් සිටින පිල්බර ගණ ගොදුරට
වෙසෙස් රුවින් තම මැව්වත් බඹහට
සඳැස් සවන් නොකළැයි වූ නොසතුට

පුන් මදාරා මල් දමින් මුදු දිගු
සුනිල් වරලස ගොතා
මන් මදා කිතු ලිය ලෙසින් උර
තුර සරා දිලි මුතු ලතා
මන් නදා වන මිණි මෙවුල් නද වෙණ
නදින් එක්කොට ඉතා
උන් එදා දුන් රඟ දුටොත් තව සක්
සැපත් කවරෙක් පතා (ලකුණු 10යි)

II කොටස.

03. (අ) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.

i. අධිෂ්ඨාන / අදිෂ්ඨාන / අධිශ්ඨාන
ii. ගෘහස්ථ / ගෘහස්ත / ගෘහශ්ථ
iii. ධර්මිෂ්ඨ / ධර්මිශ්ඨ / ධර්මිෂ්ට
iv. ඉෂ්ටාර්ථය / ඉශ්ටාර්ථය / ඉෂ්ඨාර්තය
v. උද්ඝෝෂණ / උද්ඝෝෂන / උද්ගෝෂණ (ලකුණු 05යි)

(ආ) පහත ඉරිඇදි පදවල සමාස නම් කරන්න.

i. හිරු නැගෙනහිරින් පායයි.
ii. රජතුමා දුසිරිත් කිසිවක් නොකරයි.
iii. උපාසිකාව පස්පියුම් ගෙන යයි.
iv. කුරිරු මිනිස්සු ගස්වැල් කපා දමති.
v. සියලු ඇස්වහ දුරුවේවා! (ලකුණු 05යි)

(ඇ) පහත සඳහන් සන්ධි පද විසන්ධි කරන්න.

i. යුද්ධාධාර ii. නිරවුල් iii. නියංකාලෙ iv. නෙතග v. හිඟුරළ (ලකුණු 05යි)

04. (අ) පහත සඳහන් අර්ථ දීමට තද්ධිත නාම ලියන්න.

i. උතුම්පියා ii. ගමෙහි වසන්නේ iii. දැවයෙන් නිමවන ලද

iv. රනින්ම කළ v. විශේෂ බව (ලකුණු 05යි)

04. (ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

i. මම පොත බලමි.
ii. ළමයි ක්‍රීඩා කරති.
iii. විදුහල්පති තුමා සභාව අමතයි.
iv. තාත්තා වැඩ කළේ ය.
v. උපාසකයා සිල් ගත්තේ ය. (ලකුණු 05යි)

(ඇ) පහත දැක්වෙන වාක්‍යවලට සුදුසු විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

i. ගොවියා කුඹුර කොටයි
ii. නළඟනෝ තාලයට පා තබමින් බඳ ලෙළවමින් අත් නගමින් පොළමින් මඳහස පාමින් නැටූහ
iii. මාගේ ව්‍යායාමය කිසිකලෙකත් රජසැප පිණිස නොවන්නේය යි දුටුගැමුණු රජතුමා කීය
iv. මේ බව නොදන්නේ කවුරුන් ද
v. නොනවතිවූ ඉදිරියට යවු (ලකුණු 05යි)

05. ඔබ පිරිවෙනේ වාර්ෂික ත්‍යාග ප්‍රදාන උත්සවය 2013 දෙසැම්බර් 23 දින පැවැත්වෙන බැවින් එම ත්‍යාග ප්‍රදාන උත්සවයට පැමිණෙන ලෙස අනෙකුත් පිරිවෙන් වෙත දන්වා යැවීම සඳහා ශිෂ්‍ය සමිතියේ ලේකම් ඔබ යැයි සිතා ආරාධනා පත්‍රයක් සකස් කරන්න. (ලකුණු 15යි)

## III කොටස.

06. අපූර්ව මිතුදමක් පිළිබඳ මගපෙන්වීමක් විජයබාකොල්ලය නවකතාවේ දැක් වේ. නයනානන්ද හා අසංගගේ චරිත ඇසුරින් මේ බව සනාථ කරන්න. (ලකුණු 15යි)

07. උපමා හා උපමේය භාවිත කර කදිම වර්ණනයක් කරන්නට ගුත්තිල කතුවරයා සමත් වී ඇත. ගුත්තිල මූසිල වීණා නාද තරගය ඇසුරින් මේ බව සනාථ කරන්න. (ලකුණු 15යි)

08. සංඝරාජ හිමිගේ චරිතයේ සුවිශේෂතා රැසක් සංඝරාජ සාධු චර්යාව තුළ අන්තර්ගත ය. විමසන්න. (ලකුණු 15යි)